**නිවිතිගල ප්‍රාදේශීය සභාව - 2023**

--------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

නිවිතිගල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නිවිතිගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිගණකයක වටිනාකම රු.1,329,000ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ලැබී බැංකුගත කරන ලද රු.59,950ක් මුදල් පොතට හා ආදායම් ලෙජරයට ගෙන නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ කඩකාමර කුලී බිල්කිරීම් රු.1,368,600ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | එකතුව රු.152,229ක් වූ යන්ත්‍ර හා උපකරණ සහ ඉඩම් මැනුම් ගාස්තු ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | රු.143,090ක පුස්තකාල පොත් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට වැටුප් හා මන්ත්‍රී දීමනා ශේෂය එදිනට උපයෝගී ලේඛන සමඟ සැසඳීමේදී රු.95,000 ක වෙනසක් පැවතිණි. | පළාත් සභාවෙන් ප්‍රතිපූර්ණය නොවූ මෙම මුදල මේ වන තුරුත් හිඟ වැටුපක් ලෙස ඉදිරියට යනු ලැබේ. | පළාත් සභාව සමඟ සාකච්ඡා කර නිරවුල් කළ යුතු වේ. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.27,200,050ක් වූ ගිණුම් විෂයයන් 02ක විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. | 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,163,238ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,713,191ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,886,773 | 2,717,766 | 3,224,717 | 859,010 | 2,574,429 | 2,698,119 | 2,645,318 | 1,285,333 |
| කුලී | 18,891,250 | 8,844,162 | 8,838,856 | 76,800 | 13,053,700 | 7,688,250 | 7,517,814 | 147,990 |
| බලපත්‍ර ගාස්තු | 1,680,700 | 1,258,985 | 1,258,985 | - | 1,163,590 | 1,026,705 | 1,026,705 | 1,500 |
| වෙනත් ආදායම් | 3,303,900 | 4,584,540 | 9,101,521 | - | 2,507,250 | 3,164,210 | 3,163,442 | - |
| | 26,762,623 | 17,405,453 | 22,424,079 | 935,810 | 19,298,969 | 14,577,284 | 14,353,279 | 1,434,823 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.709,134ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 05ට වඩා පැරණි රු.289,699ක ශේෂයක් ඇතුළත්ව තිබුණි. | දේපල තහනම් කිරීමට අවසන් නිවේදන සකස් කරමින් පවතී. හිඟ මුදල් අයකර ගැනීම සඳහා ජංගම වැඩසටහන් ද පැවැත්වේ. | හිඟ ආදායම් නොපමාව අය කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.116,327ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුළ වසර 03කට වඩා පැරණි රු.104,558ක ශේෂයක් ඇතුළත් වී තිබුණි. | මේ සඳහා අවසන් නිවේදන සකස් කරමින් පවතී. | -එම- |
| (ඇ) | 2023 වර්ෂය සඳහා කසළ ගාස්තු අයකිරීමට 2022 නොවැම්බර් 04 දිනැති ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර තිබුණ ද, ගාස්තු අය කර නොතිබුණි. | කසළ ගාස්තු අය කිරිම සඳහා සමීක්ෂණය අවසන් කර ඇත. ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | -එම- |
| (ඈ) | පොදු වෙළඳපොළ කඩකාමර තුළට ජලය කාන්දුවීම පිළිසකර කිරීමට සභාව කටයුතු නොකිරීමෙන් එක් කඩකාමරහිමියෙකු විසින් රු.52,000ක කුලී ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණි. | 2022 සැප්තැම්බර් සිට වසා ඇති එම කඩකාමරය අලුත්වැඩියා කර නැවත භාරදෙන තෙක් කඩ කුලිය අයකළ නොහැක. | අලුත්වැඩියා නිම කර ආදායම් රැස්කරගත යුතු වේ. |
| (ඉ) | නගරය තුළ වාහන නතර කිරීමට අවශ්‍ය පහසුකම් නොමැතිවීමෙන් වාහන හිමියන් ගාස්තු ගෙවීම ප්‍රතික්ෂේප කිරීම නිසා ගාස්තු අයකිරීම නතර කර තිබුණි. | ටෙන්ඩරය ප්‍රතික්ෂේප කරන තෙක් කාලයට අදාළව අයවිය යුතු ගාස්තුව රු.45,000ක් ගිවිසුම් ඇපයෙන් අයකර ගෙන ඇත. | අවශ්‍ය පහසුකම් සපයා දී ආදායම් රැස්කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිෂ්පාදනය කළ කොම්පෝස්ට් පොහොර තත්ත්වයෙන් අසමත් බව තිරසර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් වාර්තා කර තිබුණි. එමෙන්ම, 2021 වර්ෂයේ රු.580,000කට මිලදී ගත් දිරන කසළ කැබලි කරන යන්ත්‍රය තෙකලා විදුලිය නොමැති වීම හේතුවෙන් 2023 නොවැම්බර් වන විටත් නිෂ්කාර්යයව පැවැතිණි. | පොහොරවල ගුණාත්මකභාවය වැඩි කර ගැනීමට හා තෙකලා විදුලිය ලබා ගැනීමට කටයුතු කරමි. | ඝන අපද්‍රව්‍ය නිසි පරිදි කළමනාකරණය කළ යුතු වේ. |

## 3.2 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත පෙර පාසැල් පාලිකා තනතුරක් නොතිබියදී 2005 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා පෙර පාසැල් පාලිකාවන් 02 දෙනෙකුට රු.454,000ක් ගෙවා තිබුණි. ඉන් එක් පාලිකාවක් සේවයෙන් ඉවත්ව ගොස් තිබියදීත් ගෙවීම් කර තිබුණු අතර අනෙක් පාලිකාව මාසයකට දින 03ක් පමණක් පෙර පාසලට පැමිණෙන බව තහවුරු විය. | සේවය නොකර මෙම දීමනාව ලබාගත් පාලිකාවට ගෙවූ රු.20,000ක මුදල නැවත ගෙවන ලෙසත්, මාසයකට දින 03ක් පමණක් පැමිණෙන පාලිකාවට ගෙවූ රු.20,000ක් නැවත ගෙවන ලෙසත් ලිපි මඟින් දන්වා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ඉල්ලීම් ඉදිරිපත්ව තිබුණු අනතුරුදායක ගස් 18ක් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඒ සඳහා මිල ගණන් කැඳවීම් කළ ද කිසිඳු ප්‍රතිචාරයක් නොමැතිව, නැවත මිළ ගණන් කැඳවීමට කටයුතු කරන බව. | අනතුරුදායක බැවින් එම ගස් අප්‍රමාදව ඉවත් කළයුතු වේ. |

## 3.4 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනතුරකට පත් වූ ගලි බවුසරයක් අලුත්වැඩියා කිරීමට රු.585,000ක ඇස්තමේන්තුවක් රක්ෂණ ආයතනය වෙත ඉදිරිපත් කළද, ඊට රක්ෂණ ආයතනයේ එකඟතාව ලැබී නොමැති නිසා එම රථය 2021 නොවැම්බර් සිට මේ දක්වා අභාවිතව පවතී. | රක්ෂණ හිමිකම නොලැබේ නම්, වගකිවයුතු අයගෙන් අයකර ගැනීමට යටත්ව අලුත්වැඩියා කටයුතු සිදුකරන ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් කළ දැන්වීම අනුව අවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතී. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |